# රාජ්‍ය මූල්‍ය කටයුතු*

අයවැය ප්‍රතිපත්තියෙහි මූලික සැළකිල්ල යොමු විය යුත්තේ මිළ ස්ථායිතාවය හා සරිලන ආර්ථික වර්ධනයක් ඇතිකර ගැනීමට හැකි පරිදි මූල්‍ය විනය පවත්වා ගැනීමය. මෙම අරමුණින් යුතුව 1986 අයවැය හිඟය රුපියල් දශ ලක්ෂ 26,986 ක් හෝ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15 ක් ලෙස මුලදී ඇස්තමේන්තු කරනු ලැබිනි. කෙසේ වුවද, පහත් මට්ටමක පැවති වෙළෙඳ භෝග මිළ ගණන් හා ජාතික ආරක්ෂාව සඳහා වූ ඉහළ මට්ටමේ වියදම වැනි ඇතැම් අහිතකර තත්ත්වයන් නිසා 1986 අයවැය ඉලක්ක කරා ලඟා වීමට ඇති හැකියාව පිළිබඳ අවිනිශ්චිතතාවයන් මතු විය. මේ අනුව ආරම්භයේදී ඇස්තමේන්තු කළ අයවැය හිඟය 1986 නොවැම්බර් මසදී රුපියල් දශ ලක්ෂ 28,671 ලෙස ප්‍රතිශෝධනය කිරීමට යෙදිනි. කෙසේ වුවද, අයවැය කටයුතු සම්බන්ධයෙන් ඇති වූ අයහපත් තත්ත්වයන් මධ්‍යයේ වුවද දැනට ලැබී ඇති තාවකාලික දත්ත මගින් අනාවරණය වනුයේ රුපියල් දශ ලක්ෂ 25,596 ක සමස්ත අයවැය හිඟයකි. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව මෙය සියයට 14.3 ක් වන අතර, 1985 දී එය සියයට 15.8 කි. මේ අනුව 1985 වසරට වඩා 1986 අයවැය ක්‍රියාකාරිත්වයේ සතුටුදායක ප්‍රවණතාවක් ඇති බවක් පිළිබිඹු කරයි.

වඩා යහපත් වූ අයවැය ක්‍රියාකාරිත්වයට හේතු වූ සාධක කීපයකි. අපනයන බදු සහ නිෂ්පාදන හා නිෂ්පාදන නොවන කටයුතු වෙතින් ලත් පිරිවැටුම් බදු වෙතින් ලැබූ රජයේ ආදායම් අඩු වුවද, ආනයන බදු, සුරා බදු සහ බදු නොවන ආදායම් වෙතින් වූ ඉහළ ලැබීම් නිසා සමස්ත ආදායම වැඩි විය. තවද සංක්‍රාම ගෙවීම් සහ අනෙකුත් භාණ්ඩ හා සේවා මත වූ වියදම් වර්ධනයේ අඩුවීම නිසා වර්තන වියදම් වර්ධනය 1985 දී සියයට 17 සිට 1986 දී සියයට 3 දක්වා අඩු විය. මෑත වර්ෂවලදී සාමාන්‍ය අයවැය ප්‍රතිපාදනයන්ගෙන් බැහැරව මූල්‍යකරණය කිරීමට සිදුවූ අත්තිකාරම් ගිණුම් කටයුතුවලද කැපී පෙනෙන වැඩි දියුණු වීමක් පෙනුණි.

ආර්ථිකයෙහි ව්‍යුහාත්මක දුර්වලතාවයන් නිවැරදි කිරීමේ අවශ්‍යතාවය හඳුනාගත් මැදි කාලීන ප්‍රතිපත්ති රාමුවක් තුළ අයවැය හිඟය අඩු කිරීම සඳහා රජයේ ඇති කැපවීම, 1987 වසර සඳහා අයවැය ලේඛණය ඉදිරිපත් කරමින් රජය නැවතත් තහවුරු කරන ලදී. මෙම වැඩ සටහනට අනුව අයවැය හිඟය, 1987 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 11 සිට 1989 දී සියයට 9 දක්වා පහත දැමීමට අපේක්ෂා කෙරේ. 1987–1989 දක්වා වූ මැදි කාලීන ප්‍රතිපත්ති රාමුව තුළ රජයේ ආදායම, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 20 ක්ව නොවෙනස්ව පවත්වා ගැනීමට අපේක්ෂා කරන අතර, වියදම 1987 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 31 සිට 1989 දී සියයට 29 දක්වා අනුක්‍රමිකව අඩු කිරීමට බලාපොරොත්තු වේ. මෙම සීමාවන් ඇතුළත 1987–89 කාලච්ඡේදයන් තුළදී පුනරාවර්තන වියදම/දළ දේශීය නිෂ්පාදිතය සියයට 18.5 ක්ව පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. මේ අනුව ප්‍රාග්ධන වියදම 1987 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 12.5 සිට 1989 දී සියයට 10.5 දක්වා අනුක්‍රමිකව අඩු කිරීමක් තුළින්, අයවැය හිඟයේ ක්‍රමික අඩු කිරීමක් ලඟා කර ගැනීමට බලාපොරොත්තු වේ. මූල්‍ය පාලනය මෙන්ම වියදම් අඩු කිරීම තුළින් මෙම ඉලක්කයන් සපුරා ගැනීමට අපේක්ෂිතය.

## අයවැය තත්ත්වය

භාණ්ඩාගාර දත්ත අනුව 1986 දී රජයේ ආදායම සියයට 8 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 41,955 ක් වූ අතර අත්තිකාරම් ගිණුම් කටයුතුද ඇතුළත්ව පුනරාවර්තන වියදම පසුගිය වසරට වඩා සියයට 1 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 34,602 ක් විය. මේ හා අනුකූලව 1986 අයවැය වර්තන ගිණුම රුපියල් දශ ලක්ෂ 7,353 ක අතිරික්තයකින් යුතු වූ අතර එය මෑත වර්ෂවලදී වර්තන ගිණුමෙහි ක්‍රියාකාරිත්වය සළකා බලන කල කැපී පෙනෙන වැඩි දියුණු වීමකි.

* මෙම විග්‍රහය භාණ්ඩාගාරයෙන් සපයනු ලැබූ තාවකාලික දත්ත මත පදනම් වී ඇත. මෙම වාර්තාව මුද්‍රණයේ පවතින විට විදේශීය දීමනා ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධව ඇතැම් ප්‍රතිශෝධනයන් කරනු ලැබිනි. ප්‍රතිශෝධිත දත්ත, 1986 ආර්ථික විවරණයෙහි පළ කරනු ලැබේ.

දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් සේ රජයේ ආදයම 1985 දී සියයට 24 සිට 1986 දී සියයට 23 දක්වා අඩුවූ අතර, ප්‍රාග්ධන වියදම සියයට 18.8 සිට සියයට 18.4 දක්වා සුළු වශයෙන් අඩු විය. අත්තිකාරම් ගිණුම් කටයුතු ද ඇතුළත්ව පුනරාවර්තන වියදම දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් සේ 1985 දී සියයට 21 සිට 1986 දී සියයට 19 දක්වා අඩු විය. ණය ආපසු ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් සේ සියයට 4.2 ක්ව පසුගිය වසරෙහි මට්ටමේම පැවති අතර, ශුද්ධ මූල්‍ය හිඟය 1985 දී සියයට 11.6 සිට 1986 දී සියයට 10.1 දක්වා අඩු විය.

ශුද්ධ මූල්‍ය හිඟය විශාල වශයෙන් පියවනු ලැබුවේ විදේශීය ණය වලින් වූ අතර එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 9,046 ක් විය. විදේශීය ණය දළ නිෂ්පාදිතයෙහි කොටසක් සේ 1985 දී සියයට 4.4 සිට 1986 දී සියයට 5 දක්වා ඉහළ නැඟුණි. කෙසේ වුවද, මූල්‍යකරණ අවශ්‍යතා සඳහා විදේශීය දීමනා උපයෝජනය 1985 දී රුපියල් දශ ලක්ෂ 3,307 සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 1,505 දක්වා පහත වැටුණ අතර එම සංඛ්‍යා අඩුවෙන් සටහන් වීමක් සිදු වී ඇති බවද පෙනී ගොස් ඇත. *

අයවැය හිඟය පියවීම සඳහා ලැබුණු දේශීය සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,517 ක් වූ අතර එය පසුගිය වසරට වඩා සියයට 10 ක අඩු වීමකි. කෙසේ වුවද, බැංකු නොවන අංශයේ භාණ්ඩාගාර බිල්පත් සඳහා වැඩි වූ දයකත්වය හේතුවෙන් අයවැය හිඟය බැංකු මූලයන්ගෙන් පියවීම 1985 දී රුපියල් දශ ලක්ෂ 4,712 සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 3,047 දක්වා අඩු විය.

භාණ්ඩාගාරයේ තාවකාලික දත්තයනට අනුව පසුගිය වසර දෙක සඳහා වූ සංසන්දනාත්මක දත්ත සමඟ අය වැය ක්‍රියා මාර්ගයන්හි සාරාංශයක් සංඛ්‍යා සටහන් 1.41 හි දෙනු ලැබේ.

**ආදයම**

1986 වසරේදී රජයේ ආදයම රුපියල් දශ ලක්ෂ 41,955 ක් විය. මෙය පසුගිය වසරේ ආදයම වූ රුපියල් දශ ලක්ෂ 39,010 ට වඩා සියයට 8 ක වැඩි වීමකි. 1986 වසරේ ආදයමෙන් ආසන්න වශයෙන් හතරෙන් තුනක පමණ ප්‍රමාණයක් බදු ආදයම් වශයෙන් ලැබුණු අතර 1985 වසරෙහිදී එම ප්‍රමාණය සියයට 79 ක් විය. ආදයමෙහි ප්‍රධාන ප්‍රභවයන් දෙකක් වූ ආනයන බදු සහ පිරිවැටුම් බදු වලින් ලැබූ ආදයම රුපියල් දශ ලක්ෂ 20,067 ක් වූ අතර එය 1986 මුළු බදු ආදයමෙන් තුනෙන් දෙකක ප්‍රමාණයකට දයක විය. මුළු ආනයන වටිනාකමේ (CIF) ආන්තික අඩු වීමක් තිබියදී වුවද, රුපියල් දශ ලක්ෂ 10,014 ක් වූ ආනයන බදු ආදයම පසුගිය වසරට වඩා සියයට 19 ක වැඩි වීමක් වාර්තා කෙරුණි. බොර තෙල් ආනයනයන් වෙතින් වූ ඉහළ බදු එකතුව සහ ඉහළ බදු අනුපාතිකයන්ගෙන් යුත් පාරිභෝගික භාණ්ඩ ආනයනයන්ගේ වැඩිවීම මෙයට ප්‍රධාන හේතුව විය.

රුපියල් දශ ලක්ෂ 10,052 ක් වූ පිරිවැටුම් බදු, මුළු බදු ආදයමෙන් තුනෙන් එකක ප්‍රමාණයකට දයක විය. කෙසේ වුවද, නිෂ්පාදන හා නිෂ්පාදනමය නොවන කටයුතු වෙතින් වූ අඩු ලැබීම් හේතුවෙන් මුළු පිරිවැටුම් බදු ආදයම පසුගිය වසරට වඩා සියයට 1 ක ආන්තික අඩු වීමක් පෙන්නුම් කෙරුණි. නිෂ්පාදනමය කටයුතු වලින් ලත් බදු ලැබීම් සියයට 14 ක අඩු වීමක් පිළිබිඹු කළ අතර නිෂ්පාදනමය නොවන කටයුතු වලින් ලත් ලැබීම් සියයට 7 ක අඩු වීමක් වාර්තා කෙරුණි. ප්‍රධාන වශයෙන් පාරිභෝගික භාණ්ඩ ආනයනයන්ගේ ඉහළ මට්ටම හේතුවෙන් ආනයන මත වූ පිරිවැටුම් බදු ලැබීම් සියයට 15 ක වැඩි වීමක් වාර්තා කරනු ලැබින.

* ඇතැම් රාජ්‍ය ආයතනයන්ගෙන් සම්පූර්ණ තොරතුරු භාණ්ඩාගාරයට නොලැබීම නිසා අයවැය කටයුතු සඳහා උපයෝජනය කරගත් විදේශ දීමනා ප්‍රමාණය අඩුවෙන් සටහන් කිරීමකට හේතුවන්නට ඇත. ප්‍රතිශෝධිත දත්ත 1986 ආර්ථික විවරණයෙහි පළ කරනු ලැබේ.

## 1.41 සංඛ්‍යා සටහන

## රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය

| | රුපියල් දශ ලක්ෂ | | | ද.දේ.නි. අනුපාතය (%) | | |
|---|---|---|---|---|---|---|
| | 1984 | 1985* | 1986* | 1984 | 1985* | 1986* |
| 1. ආදායම .. | 37,731 | 39,010 | 41,955 | 24·5 | 24.0 | 23·4 |
| බදු ආදායම .. | (31,215) | (30,745) | (31,693) | (20·3) | (18·9) | (17·7) |
| බදු නොවන ආදායම .. | (6,516) | (8,265) | (10,262) | (4·2) | (5.1) | (5.7) |
| 2. වියදම .. | – 53,592 | – 64,685 | – 67,551 | – 34.8 | – 39·8 | – 37.6 |
| වර්තන වියදම .. | (– 28,926) | (– 33,842) | (– 34,772) | (– 18·8) | (– 20·8) | (– 19·4) |
| අත්තිකාරම් ගිණුම් කටයුතු .. | (– 2,916) | (– 314) | (170) | (– 1.9) | (– 0·2) | (0·1) |
| ප්‍රාග්ධන වියදම .. | (– 21,750) | (– 30,529) | (– 32,949) | (– 14·1) | (– 18·8) | (– 18·4) |
| 3. වර්තන ගිණුම් අතිරික්තය/හිඟය (–) | 5,889 | 4,854 | 7,353 | 3.8 | 3·0 | 4.1 |
| 4. සමස්ත අයවැය හිඟය (–) .. | – 15,861 | – 25,676 | – 25,596 | – 10·3 | – 15·8 | – 14·3 |
| 5. ණය ආපසු ගෙවීම් .. | 2,229 | 6,897 | 7,529 | 1·4 | 4.2 | 4·2 |
| 6. ශුද්ධ මූල්‍ය හිඟය .. | – 13,632 | – 18,779 | – 18,067 | – 8.9 | – 11.6 | – 10·1 |
| 7. සමස්ත අයවැය හිඟය පියවීම | | | | | | |
| විදේශීය .. | 11,251 | 12,205 | 13,575 | 7·3 | 7.5 | 7·6 |
| ණය .. | (7,958) | (8,898) | (12,070) | (5·2) | (5.5) | (6·7) |
| දීමනා .. | (3,293) | (3,307) | (1,505) | (2·1) | (2·0) | (0·8) |
| දේශීය .. | 4,610 | 13,470 | 12,022 | 3·0 | 8·3 | 6·7 |
| බැංකු .. | (– 2,644) | (7,451) | (2,299) | (– 1·7) | (4·6) | (1·3) |
| බැංකු නොවන .. | (6,588) | (8,520) | (8,963) | (4·3) | (5·2) | (5·0) |
| මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම් | (666) | (– 2,501) | (760) | (0·4) | (– 1.5) | (0·4) |
| 8. ශුද්ධ මූල්‍ය හිඟය පියවීම .. | | | | | | |
| විදේශීය .. | 9,785 | 10,416 | 10,550 | 6·4 | 6·4 | 5.9 |
| ණය .. | (6,492) | (7,109) | (9,046) | (4·2) | (4·4) | (5·0) |
| දීමනා .. | (3,293) | (3,307) | (1,505) | (2·1) | (2·0) | (0·8) |
| දේශීය .. | 3,848 | 8,363 | 7,517 | 2.5 | 5.1 | 4·2 |
| බැංකු .. | (– 2,760) | (7,212) | (2,287) | (– 1.8) | (4·4) | (1·3) |
| බැංකු නොවන .. | (5,942) | (3,652) | (4,470) | (3.9) | (2·2) | (2.5) |
| මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම් | (666) | (– 2,501) | (760) | (0·4) | (– 1·5) | (0·4) |
| 9. බැංකු අංශයෙන් වූ ශුද්ධ ණය ගැනීම් .. | – 2,095 | 4,712 | 3,047 | – 1·4 | 2·9 | 1·7 |

* තාවකාලික

මූලයන් : මහා භාණ්ඩාගාරය;
ශ්‍රී ලංකා මහ බැංකුව.

වට්නාකම අනුව අය කරන තේ බදු ලැබීම්හි සියයට 94 ක පහත වැටීමක් තිබූ නමුදු 1986 දී වරණ අලෙවි බදු වෙතින් ලත් මුළු ආදායම සියයට 12 ක වැඩි වීමක් පෙන්නුම් කෙරුණි. රුපියල් දශ ලක්ෂ 2,927 ක් වූ දුම්කොළ බදු ආදායම් ලැබීම් සියයට 56 ක කැපී පෙනෙන වැඩි වීමක් වාර්තා කල අතර, රුපියල් දශ ලක්ෂ 1,485 ක් වූ මත්පැන් බදු ආදායම සියයට 35 ක ඉහළ යාමක් පිළිබිඹු කරනු ලැබිනි. 1985 නොවැම්බර් මස සිට සුරා බදු අනුපාතිකයන් ඉහළ නැංවීමේ ප්‍රතිශෝධනය මෙම ප්‍රභවයන් වෙතින් වූ ලැබීම්හි සැළකිය යුතු වර්ධනයට හේතු විය. පහත වැටුනු තේ මිල සහ එහි ප්‍රතිවිපාක වශයෙන් බදු පැනවෙන මිල කිලෝ ග්‍රැමයකට රුපියල් 40 සිට රුපියල් 32 දක්වා ප්‍රතිශෝධනය කිරීම, වට්නාකම අනුව අය කරන තේ බදු ලැබීම් රුපියල් දශ ලක්ෂ 62 දක්වා අඩු වීමට හේතු විය. මෙය 1978 සිට මේ දක්වා වූ කාලය තුල වාර්තාගත වූ අඩුම තේ බදු ආදායම් ලැබීම විය.

අපනයනයන් වෙතින් ලත් මුළු ආදායම් එකතුව වූ රුපියල් දශ ලක්ෂ 1,573 වෙතින් ඉකුත් වසරට වඩා සියයට 16 ක අඩු වීමක් වාර්තා කෙරුණි. 1986 වසරෙහි දී තේ අපනයන ප්‍රමාණය සියයට 5 කින් වැඩි වූ නමුදු අපනයන බදු ලැබීම් සියයට 21 කින් අඩු විය. 1985 නොවැම්බර් මස සිට සියළුම වර්ගයේ තේ සඳහා බදු අනුපාතිකයන් කිලෝ ග්‍රැමයකට රුපියල් 2 කින් අඩු කිරීම මෙයට මූලික හේතුව විය. අනෙක් අතට රබර් අපනයනයන්ගේ අඩු වීමක් තිබියදී වුවද රුපියල් වට්නාකම අනුව රබර් මිල ගණන් ඉහළ යාම හේතුකොටගෙන රබර් අපනයන

බදු ආදායම 1986 දී සියයට 21 කින් වැඩි විය. පොල් අපනයන පරිමාව සියයට 18 කින් ඉහළ ගිය නමුදු පොල් මිලෙහි තියුණු පහත වැටීම සහ ඒ හා අනුකූලව අපනයන බදු අනුපාතිකයන් පහත වැටෙන සේ සංශෝධනය කිරීමේ හේතුවෙන් පොල් අපනයන බදු ආදායම පසුගිය වසරට වඩා තුනෙන් එකක ප්‍රමාණයකින් අඩු විය.

සාමූහික සහ සාමූහික නොවන ආදායම් මත වූ රුපියල් දශ ලක්ෂ 4,787 ක බදු ලැබීම් පසුගිය වසරෙහි වූ රුපියල් දශ ලක්ෂ 5,586 ක ලැබීමට වඩා 1986 දී සියයට 14 කින් පහත වැටුණි. රුපියල් දශ ලක්ෂ 3,274 ක් වූ සාමූහික ආදායම් බදු සියයට 21 ක අඩු වීමක් සනිටුහන් කරනු ලැබිනි. විශේෂයෙන් තේ සහ පොල් මිල පහත වැටීමේ හේතුකොටගෙන වැවිලි කෘෂිකර්මාන්තය ආශ්‍රිත බදු පදනම අහිමි වී යාම මෙයට ප්‍රධාන හේතුව විය. බදු නිදහස් සීමාව රුපියල් 24,000 සිට රුපියල් 27,000 දක්වා ඉහළ දැමීම සහ බදු කාණ්ඩ පුළුල් කිරීමක් තිබියදී වුවද, පුද්ගලික ආදායම් බදු එකතුව සියයට 6 කින් ඉහළ නැඟුණි.

රජයේ ආදායමෙහි ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරන දර්ශක 1.42 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**වියදම**

1986 වසරෙහිදී, සියයට 4 ක වැඩි වීමක් පෙන්නුම් කරමින් රජයේ වියදම රුපියල් දශ ලක්ෂ 67,551 ක් විය. 1985 දී වූ සියයට 21 ක වර්ධනය හා සලකන කළ වසර තුළදී වියදම් වර්ධන වේගයෙහි තියුණු පසුබෑමක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, වියදම්/ද. දේ. නි. අනුපාතය 1985 දී සියයට 40 සිට 1986 දී සියයට 38 දක්වා අඩු විය.

ඉකුත් වසරෙහි වූ සියයට 17 ක වැඩිවීම හා සසඳන කල, සියයට 3 ක වැඩි වීමක් පෙන්නුම් කරමින් වර්තන වියදම රුපියල් දශ ලක්ෂ 34,772 ක් විය. තාවකාලික දත්තයනට අනුව, 1986 වසරෙහිදී වැටුප් සහ දීමනා සඳහා වූ වියදම, ඉකුත් වසරට වඩා සියයට 19 ක වැඩි වීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 8,979 ක් විය. වැටුප් සහ දීමනා, 1986 මුළු වර්තන වියදමින් සියයට 26 ක් වූ අතර, එය 1985 දී සියයට 22 ක් විය. රුපියල් දශ ලක්ෂ 9,294 ක් වූ රජයේ ණය සඳහා වූ මුළු පොළී, මුළු වර්තන වියදමෙන් සියයට 27 කට හිමිකම්පානු ලැබිනි. මෙය, ඉකුත් වසරට වඩා සියයට 12 ක වැඩි වීමකි. 1986 වසරෙහිදී, විශ්‍රාම වැටුප් ගෙවීම් සියයට 9 කින් වැඩි වූ අතර, භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් සහ අනෙකුත් සංක්‍රාමයන් මත වූ රුපියල් දශ ලක්ෂ 13,515 ක වියදම සියයට 11 ක අඩු වීමක් වාර්තා කරනු ලැබිනි.

රුපියල් දශ ලක්ෂ 32,949 ක් වූ දළ ප්‍රාග්ධන වියදම ඉකුත් වසරට වඩා සියයට 8 ක වැඩි වීමක් පෙන්නුම් කරනු ලැබිනි. රුපියල් දශ ලක්ෂ 7,529 ක් වූ ණය ආපසු ගෙවීම් අත්හල විට ශුද්ධ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 25,420 ක් විය. සැසඳීමේදී ඉකුත් වසරෙහිදී ශුද්ධ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 23,632 ක් විය. වසර තුළදී රුපියල් දශ ලක්ෂ 5,422 ක පරිපූරක ප්‍රාග්ධන වියදම් ප්‍රතිපාදන, මූලික අයවැය ප්‍රතිපාදන වූ රුපියල් දශ ලක්ෂ 22,990 ක ප්‍රමාණය, රුපියල් දශ ලක්ෂ 28,412 දක්වා ඉහළ නංවනු ලැබිනි. කෙසේ වුවද, ඉකුත් වසරෙහි වූ සියයට 8 හා සැසඳීමේදී වසර තුළදී මුළු ප්‍රතිපාදනයන්ගෙන් සියයට 7 ක ඌන උපයෝජනයක් පැවති බව තාවකාලික දත්ත මගින් අනාවරණය කෙරිනි.

අමාත්‍යාංශ අනුව කරනු ලබන වර්ගීකරණයට අනුව, ආරක්ෂක (රුපියල් දශ ලක්ෂ 5,494) මුදල් හා ක්‍රම සම්පාදන (රුපියල් දශ ලක්ෂ 4,649) සහ මහවැලි සංවර්ධන (රුපියල් දශ ලක්ෂ 3,988) යන අමාත්‍යාංශ තුන 1986 මුළු ප්‍රාග්ධන වියදමින් සියයට 53 කට හිමිකම් පානු ලැබිනි. ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 1,346 ක් වූ අතර, ඉන් විශාල ප්‍රමාණයක් නිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ යෝජනා ක්‍රමය හා ආශ්‍රිතව විය. පළාත් පාලන නිවාස සහ ඉදි කිරීම් අමාත්‍යාංශය රුපියල් දශ ලක්ෂ 1,677 ක මුදලක්

## 1.42 සංඛ්‍යා සටහන

## රජයේ ආදායම් ක්‍රියාවලිය*


| | වර්ධන අනුපාතිකය (%) | | | ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් | | | මුළු ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1984 | 1985 | 1986 | 1984 | 1985 | 1986 | 1984 | 1985 | 1986 |
| 1. බදු ආදායම .. .. | 50·8 | – 1·5 | 3·5 | 20·3 | 18·9 | 17·7 | 82·7 | 78.8 | 75·9 |
| 1.1 නිෂ්පාදන හා වියදම් මත පැනවූ බදු .. .. | 48·5 | – 2·4 | 7·4 | 16·7 | 15·4 | 15·0 | 68·0 | 64·2 | 64·1 |
| 1.1.1 පොදු විකුණුම් සහ පිරිවැටුම් බදු .. .. | 30·8 | 25·1 | – 1·3 | 5·3 | 6·3 | 5·6 | 21·6 | 26·1 | 24·0 |
| 1.1.2 වරණ අලෙවි බදු .. .. | 79·2 | – 30·6 | 11·5 | 3·8 | 2·5 | 2·5 | 15·3 | 10·3 | 10·7 |
| 1.1.3 ආනයන බදු .. .. | 64·3 | 5·7 | 19·3 | 5·2 | 5·2 | 5·6 | 21·0 | 21·5 | 23·9 |
| 1.1.4 අපනයන බදු .. .. | 29·1 | – 41·0 | – 16·0 | 2·1 | 1·2 | 0·9 | 8·4 | 4·8 | 3·8 |
| 1.1.5 බලපත්‍ර ගාස්තු .. .. | 3·2 | – 3·1 | 51·6 | 0·1 | 0·1 | 0·2 | 0·5 | 0·5 | 0·7 |
| 1.1.6 දේපල පැවරුම් බදු .. .. | 21·1 | – 4·7 | 30·2 | 0·3 | 0·2 | 0·3 | 1·1 | 1·0 | 1·2 |
| 1.2 සාමූහික සහ සාමූහික නොවන ආදායම් මත පැනවූ බදු .. | 62·7 | 1·9 | – 14·3 | 3·6 | 3·4 | 2·6 | 14·5 | 14·3 | 11·4 |
| 1.2.1 සාමූහික .. .. | 50·3 | 11·9 | – 21·3 | 2·4 | 2·6 | 1·8 | 9·8 | 10·7 | 7·8 |
| 1.2.2 සාමූහික නොවන .. .. | 97·5 | – 19·1 | 6·2 | 1·1 | 0·9 | 0·8 | 4·7 | 3·6 | 3·6 |
| 1.3 ප්‍රාග්ධන පැවරුම් බදු .. .. | 34·4 | 35·4 | 27·9 | ... | 0·1 | 0·1 | 0·2 | 0·3 | 0·3 |
| 2. බදු නොවන ආදායම .. .. | 44·2 | 26·8 | 21·0 | 4·2 | 5·1 | 5·6 | 17·3 | 21·2 | 24·1 |
| 2.1 රාජ්‍ය වෙළෙඳ ව්‍යවසායයන්හි දළ ලැබීම් .. .. | 42·0 | 15·5 | – 3·0 | 1·2 | 1·3 | 1·2 | 4·9 | 5·5 | 5·0 |
| 2.2 පොළී, ලාභ සහ ලාභාංශ .. .. | 143·1 | 77·2 | 50·0 | 1·1 | 1·8 | 2·4 | 4·3 | 7·4 | 10 3 |
| 2.3 විකුණුම් සහ ගාස්තු .. .. | 24·0 | 88·7 | – 34·0 | 0·3 | 0·5 | 0·3 | 1·2 | 2·1 | 1·3 |
| 2.4 සමාජ සංරක්ෂණ දායක මුදල් .. .. | 19·0 | 6·0 | 19·1 | 0·1 | 0·1 | 0·1 | 0·2 | 0·2 | 0·3 |
| 2.5 අනෙකුත් වර්තන පැවරුම් .. .. | – 30·0 | 73·0 | 36·9 | 0·2 | 0·3 | 0·4 | 0·8 | 1·3 | 1·7 |
| 2.6 ප්‍රාග්ධන භාණ්ඩ විකුණුම් .. .. | 32·6 | 15·3 | 53·3 | ... | ... | ... | ... | ... | 0·1 |
| 2.7 ණය සහ අත්තිකාරම් ආපසු ගෙවීම් .. .. | 253·0 | – 52·1 | 101·6 | 0·3 | 0·2 | 0·3 | 1·4 | 0·6 | 1·2 |
| 2.8 මහ බැංකු ලාභ මාරුකිරීම් .. .. | 10·0 | – 9·1 | 18·6 | 1·1 | 0·9 | 1·0 | 4·4 | 3·8 | 4·2 |
| එකතුව .. .. | 49·7 | 3·4 | 7·7 | 24·5 | 24·0 | 23·4 | 100·0 | 100·0 | 100.0 |

* රජයේ ආදායම පිළිබඳ වැඩි විස්තර සංඛ්‍යා ලේඛන පරිශිෂ්ඨයේ දක්වා ඇත.

UNIVERSITY OF MORATUWA, SRI LANKA
LIBRARY

මූලයන් : මහා භාණ්ඩාගාරය,
ශ්‍රී ලංකා මහ බැංකුව.

# රජයේ ආදායම සහ වියදම




ශ්‍රී ලංකා මහ බැංකුව.

උපයෝජනය කල අතර, මෙයින් රුපියල් දශ ලක්ෂ 655 ක මුදලක් පළාත් පාලන අධිකාර ප්‍රදේශවලට ජල සම්පාදන පහසුකම් තැනීම සඳහා විය. මෙයට අමතරව, පැල්පත් වාසීන්ට අඩු වියදම් නිවාස ඉදි කිරීම් සඳහා තවත් රුපියල් දශ ලක්ෂ 465 ක මුදලක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් උපයෝගි කරගනු ලැබිනි. ප්‍රවාහන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 1,061 ක් වූ අතර, මේ අතුරින් සියයට 65 ක් දුම්රිය මැදිරි සහ දුම්රිය යන්ත්‍ර සඳහා උපයෝගී කර ගන්නා ලදී. අනෙකුත් ප්‍රධාන වියදම් දරූ අමාත්‍යාංශ වූයේ ජාතික ආරක්ෂක (රුපියල් දශ ලක්ෂ 942), මහා මාර්ග (රුපියල් දශ ලක්ෂ 880) සහ තැපැල් සහ විදුලි සංදේශ (රුපියල් දශ ලක්ෂ 600) යන අමාත්‍යාංශයි.

## අයවැය හිඟය පියවීම

තාවකාලික දත්තයනට අනුව, 1986 වසරෙහිදී අයවැය කටයුතුවලින් රුපියල් දශ ලක්ෂ 25,596 ක සමස්ත අයවැය හිඟයක් ඇති විය. එය පසුගිය වසරට වඩා සුළු අඩු වීමකි. සමස්ත අයවැය හිඟය, මුළු වියදමට සාපේක්ෂව සියයට 38 ක් වූ අතර, සැසඳීමේදී 1985 දී එය සියයට 40 ක් විය. රුපියල් දශ ලක්ෂ 7,529 ක ණය ආපසු ගෙවීම් ප්‍රමාණයක්ද සැළකිල්ලට ගත් කල 1986, රාජ්‍ය මූල්‍ය කටයුතු වෙතින් රුපියල් දශ ලක්ෂ 18,067 ක ශුද්ධ හිඟයක් වාර්තා කරනු ලැබිනි. මෙය පසුගිය වසරෙහිදී වාර්තා කරන ලද හිඟය වූ රුපියල් දශ ලක්ෂ 18,779 ට වඩා සුළු වශයෙන් අඩුවීමකි.

ශුද්ධ මූල්‍ය හිඟය පියවීමේදී රජය, රුපියල් දශ ලක්ෂ 10,550 ක් ණය හා දීමනා වශයෙන් විදේශීය ප්‍රභවයන්ගෙන් රැස්කර ගත් අතර රුපියල් දශ ලක්ෂ 7,517 ක් දේශීය ප්‍රභවයන්ගෙන් ලබා ගති. රුපියල් දශ ලක්ෂ 9,046 ක් වූ විදේශීය ශුද්ධ ණය ගැනීම් ප්‍රමාණය ඉකුත් වසරට වඩා සියයට 27 ක වැඩි වීමක් පිළිබිඹු කරමින් ආසන්න වශයෙන් ශුද්ධ මූල්‍ය හිඟයෙන් භාගයක ප්‍රමාණයක් විය. සැසඳීමේදී එය 1985 දී සියයට 38 ක් විය. කෙසේ වුවද, ශුද්ධ මූල්‍ය හිඟය පියවීමේදී, විදේශීය ශුද්ධ දීමනා උපයෝජනය 1985 දී රුපියල් දශ ලක්ෂ 3,307 සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 1,505 දක්වා පහත වැටුණි. පසුගිය වසරේදී මෙම දීමනා ශුද්ධ මූල්‍ය හිඟයෙන් සියයට 18 කට හිමිකම් පෑ අතර එය මෙම වසරේදී සියයට 8 ක් විය.

හිඟය පියවීම සඳහා දේශීය ප්‍රභවයන්ගෙන් සම්පත් ලබා ගැනීමේදී, රජය ප්‍රධාන වශයෙන් බැංකු නොවන ණය ගැනීම් කෙරෙහි යොමු වූ අතර, එමගින් රුපියල් දශ ලක්ෂ 4,470 ක මුදලක් ලබා ගති. බැංකු ක්‍රමයෙන් ලබාගත් ණය රුපියල් දශ ලක්ෂ 3,047 කින් සමන්විත විය. මේ අනුව දේශීය බැංකු නොවන ණය ගැනීම් ඉකුත් වසරට වඩා සියයට 22 කින් වැඩි වීමක් වාර්තා කරමින් ශුද්ධ මූල්‍ය හිඟයෙන් හතරෙන් එකක ප්‍රමාණයක් පියවීමට දායක විය. හිඟය පියවීමේදී ප්‍රධාන බැංකු නොවන ප්‍රභවයන් වූයේ රුපියල් ණය වැඩ පිළිවෙල සඳහා දායකත්වයන් සැපයූ සේවක අර්ථ සාධක අරමුදල (සේ. අ. අ.) හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව (ජා. ඉ. බැ.) ද, භාණ්ඩාගාර බිල්පත් නිකුතුව සඳහා දායකත්වයන් සැපයූ ලංකා විදුලි බල මණ්ඩලයද වේ.

1986 වසරෙහිදී, බැංකු ක්‍රමයෙන් රජයේ ශුද්ධ ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 3,047 කට සීමා වූ අතර, එය ඉකුත් වසරේ ණය ගැනීම් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 4,712 හා සසඳන විට සියයට 35 කින් අඩු වීමකි. මුළු බැංකු ණය ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 1,892 ක ප්‍රමාණයක් භාණ්ඩාගාර බිල්පත් මගින් සැපයුනු අතර, මහ බැංකු අත්තිකාරම් වෙතින් රුපියල් දශ ලක්ෂ 407 ක් සැපයිනි. හිඟය පියවීමේදී, මුදල් හා බැංකු ශේෂ රුපියල් දශ ලක්ෂ 760 ක් උපයෝජනය කරන ලද අතර 1985 දී මුදල් ශේෂ ඉහළ නැඟුණි.

**රාජ්‍ය ණය**

1986 වසර අවසානයේදී නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,56,293 ක් විය. පසුගිය වසරේ වූ සියයට 24 ක වර්ධනය හා සසඳන කල, මෙය සියයට 19 ක වැඩි වීමකි. දේශීය ණය රුපියල් දශ ලක්ෂ 70,085 ක් වූ අතර, විනිමය අනුපාතිකයෙහි උච්චාවචනයන් නිසා ඇති වූ අතිරේක වගකීම් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 9,543 ක්ද ඇතුළත්ව විදේශීය ණය රුපියල් දශ ලක්ෂ 86,208 ක් විය. පසුගිය වසරේ සංසන්දනාත්මක දත්තයන් සමඟ නොපියවූ ණයවල සංයුතිය 1.43 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**1.43 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය ණය**


| | රුපියල් දශ ලක්ෂ | | | | වෙනස ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | නොපියවූ ප්‍රමාණය | | වෙනස | | | |
| | 1985 | 1986 | 1985 | 1986 | 1985 | 1986 |
| 1. දේශීය ණය .. | 63,196·7 | 70,084·3 | 10,959·8 | 6,887·6 | 21·0 | 10·9 |
| 1.1 මැදි හා දිගුකාලීන ණය .. | 36,689·1 | 39,277·2 | 3,365·3 | 2,588·1 | 10·1 | 7·1 |
| 1.1.1 රුපියල් ණය .. | 36,570·1 | 39,129·8 | 3,342·8 | 2,559·7 | 10·1 | 7·0 |
| 1.1.2 පරිපාලන ණය .. | 119·0 | 147·4 | 22·5 | 28·4 | 23·6 | 23·9 |
| 1.2 කෙටිකාලීන ණය .. | 26,507·6 | 30,207·1 | 7,594·0 | 4,299·5 | 40·2 | 16·2 |
| 1.2.1 භාණ්ඩාගාර බිල්පත් | 22,280·0 | 26,172·6 | 7,420·0 | 3,892·6 | 49·9 | 17·5 |
| 1.2.2 බදු සංචිත සහතික පත් | 9·4 | 9·0 | – 0·2 | – 0·4 | – 2·1 | – 4·2 |
| 1.2.3 මහ බැංකු අත්තිකාරම් | 4,218·2 | 4,625·5 | 174·7 | 407·3 | 4·3 | 9·7 |
| 2. විදේශීය ණය .. | 67,673·2 | 86,208·3 | 13,992·4 | 18,535·1 | 26·1 | 27·4 |
| 2.1 ව්‍යාපෘති ණය .. | 36,405·9 | 50,417·9 | 10,434·9 | 14,012·0 | 40·2 | 38·5 |
| 2.2 භාණ්ඩ ණය .. | 22,372·9 | 27,765·8 | 3,946·6 | 5,392·9 | 21·4 | 24·1 |
| 2.3 අනෙකුත් ණය .. | 8,894·4 | 8,024·6 | – 389·1 | – 869·8 | 4·2 | – 9·8 |
| එකතුව .. | 130,869·9 | 156,952·6 | 24,952·2 | 25,422·7 | 23·6 | 19·4 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1985 වසරේ සියයට 21 ක වර්ධනයක් හා සසඳන කල මුළු දේශීය ණය ප්‍රමාණය 1986 වසරේදී සියයට 11 කින් ඉහළ නැඟුණි. 1986 වර්ෂයේදී දේශීය ණය වර්ධනය අඩුවීමට මූලික වශයෙන් හේතු වූයේ භාණ්ඩාගාර බිල්පත් සහ රුපියල් සුරකුම් පත් මගින් වූ අඩු ණය ලබා ගැනීමය. කෙසේ වුවද 1986 දී කෙටි කාලීන ණය ගැනීම් දිගු කාලීන ණය ගැනීම් ප්‍රමාණය ඉක්මවා ගිය අතර, ඒ හා අනුකූලව මුළු දේශීය ණය ප්‍රමාණයෙහි කෙටි කාලීන ණය කොටස 1985 වසරේදී සියයට 42 සිට 1986 වසරේදී සියයට 44 දක්වා වැඩි විය.

භාණ්ඩාගාර බිල්පත්, රජය විසින් කෙටි කාලීන ණය ලබා ගැනීමේ ප්‍රධානතම උපකරණය ලෙස නොකඩවා පැවතුණි. පසුගිය වසරේ රුපියල් දශ ලක්ෂ 7,420 සමඟ සසඳන විට 1986 වසරේදී භාණ්ඩාගාර බිල්පත් මගින් ලබා ගත් මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,893 ක් විය. මේ අනුව භාණ්ඩාගාර බිල්පත් මත නොපියවන ලද ණය වගකීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 22,280 සිට 1986 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 26,173 ක් දක්වා වැඩි විය. මෙම භාණ්ඩාගාර බිල්පත් මත වැඩි වන වගකීම්වලට සරිලන පරිදි නොපියවන ලද භාණ්ඩාගාර බිල්පත් අනුදත් සීමාව 1986 නොවැම්බර් 21 සිට රුපියල් දශ ලක්ෂ 25,000 සිට රුපියල් දශ ලක්ෂ 35,000 දක්වා වැඩි කරනු ලැබින.


# රාජ්‍ය ණය සංයුතිය




* දළ රාජ්‍ය ණය වලින් නිදන් අරමුදල් අඩු කළ පසු.

ශ්‍රී ලංකා මහ බැංකුව.

# දේශීය ණය සංයුතිය




ශ්‍රී ලංකා මහ බැංකුව.

* දළ දේශීය ණය වලින් නිදන් අරමුදල් අඩුකල පසු.

භාණ්ඩාගාර බිල්පත් සඳහා බැංකු නොවන අංශයේ ආයෝජන රුපියල් දශ ලක්ෂ 2,249 ක්වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 1,838 ක්ම ලංකා විදුලි බල මණ්ඩලය මගින් කරනු ලැබූ ආයෝජන විය. ජාතික ඉතිරි කිරීමේ බැංකුව, විවිධ අර්ථ සාධක අරමුදල් සහ භාරකාර අරමුදල් ඇතුළුව අනිකුත් ආයෝජකයන් විසින් කරන ලද දායකත්වය රුපියල් දශ ලක්ෂ 411 ක් විය. මේ අනුව බැංකු නොවන අංශය, නොපියවන ලද භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයෙහි දූරු කොටස සියයට 15 දක්වා වැඩි කරමින් බැංකු නොවන අංශයේ භාණ්ඩාගාර බිල්පත් සඳහා දායකත්වය 1985 දී රුපියල් දශ ලක්ෂ 1,659 ක සිට එය 1986 දී රුපියල් දශ ලක්ෂ 3,908 දක්වා තියුණු ලෙසින් ඉහළ නැඟුණි.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් රජයට සපයන තාවකාලික අත්තිකාරම්වල වැඩි වීම 1986 දී රුපියල් දශ ලක්ෂ 407 ක් වූ අතර 1986 අවසානයේදී නොපියවන ලද වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,626 ක් විය. 1980 සහ 1983 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට දෙනු ලැබූ රුපියල් දශ ලක්ෂ 585 ක විශේෂ ණය මුදලක්ද මෙහි ඇතුළත්ය.

මැදි හා දිගු කාලීන දේශීය ණය මුළුමනින්ම පාහේ සෑදුම් ලත් රුපියල් ණයවල නොපියවන ලද ණය වගකීම 1986 වසරේදී සියයට 7 කින් ඉහළ නැඟුණි. පසුගිය වසර හා සැසඳීමේදී එය සියයට 10 ක වර්ධනයක් විය. රුපියල් සුරකුම් පත් විකුණුම් මගින් රුපියල් දශ ලක්ෂ 7,777 ක් ලබා ගත් නමුදු නොපියවන ලද රුපියල් ණය වගකීම ඉහළ නැඟුනේ රුපියල් දශ ලක්ෂ 2,560 කින් පමණි. මෙයට හේතු වූයේ කල් පිරුණු සුරකුම් පත් සඳහා රුපියල් දශ ලක්ෂ 5,216 ක් ආපසු ගෙවීමට සිදු වීමයි.

මීට පෙරදී මෙන්ම රුපියල් ණය සඳහා ප්‍රධාන දායකයන් වූයේ සේවක අර්ථ සාධක අරමුදල සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවයි. 1985 වර්ෂයෙහිදී වූ රුපියල් දශ ලක්ෂ 4,418 සමඟ සසඳන විට 1986 වසරේදී සේවක අර්ථ සාධක අරමුදල රුපියල් දශ ලක්ෂ 5,118 ක් ආයෝජනය කළේය. සේවක අර්ථ සාධක අරමුදල මගින් රුපියල් ණය සඳහා කරන ලද ආයෝජනය 1986 වසරේ ලබා ගත් මුළු රුපියල් ණය ප්‍රමාණයෙන් සියයට 66 ක් වූ අතර 1985 දී එය සියයට 42 ක් විය. වැඩි වූ සාමාජිකත්ව දායක මුදල් සහ කලින් කරන ලද ආයෝජන වලින් ලැබුණු ආදායම මගින් සේවක අර්ථ සාධක අරමුදලට එහි ආයෝජන වැඩි කිරීමට හැකි විය.


1986 වසරේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් රුපියල් ණයවල රුපියල් දශ ලක්ෂ 2,383 ක් ආයෝජනය කළ අතර සැසඳීමේදී 1985 දී එය රුපියල් දශ ලක්ෂ 5,630 ක් විය. මෙසේ ආයෝජනය අඩු වීමට හේතු වූයේ ආයෝජනය කළහැකි සම්පත්වල අඩු වීමයි. 1986 වසරේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව මගින් රැස් කළ මුළු ඉතුරුම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 925 ක් වූ අතර සැසඳීමේදී 1986 දී එය රුපියල් දශ ලක්ෂ 1,645 ක් විය. කල් පිරුණු ආයෝජනයන්ගෙන් ලැබීම් රුපියල් දශ ලක්ෂ 1,504 ක් වූ අතර, පසුගිය ආයෝජනයන්ගෙන් ලැබීම් රුපියල් දශ ලක්ෂ 1,733 ක් විය.

අනිකුත් මාර්ග වලින් රුපියල් සුරකුම්පත් සඳහා කරන ලද මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 276 ක් විය. මෙය විශ්‍රාම වැටුප් හා අර්ථ සාධක අරමුදල් (රුපියල් දශ ලක්ෂ 219), ජාතික රක්ෂණ සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 40) සහ ජාතික නිවාස නිදන් අරමුදල (රුපියල් දශ ලක්ෂ 17) මගින් සමන්විත විය.

**විදේශීය ණය**

1986 වසරේදී දළ විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 12,060 ක් විය. 1986 දී විදේශීය ණය විගැහි වටිනාකම් අනුව පසුගිය වසරට වඩා සියයට 1 කින් වැඩි වූ නමුදු විනිමය අනුපාතිකයේ වූ වෙනස්වීම් හේතුවෙන් මෙම ණය රුපියල් වටිනාකම අනුව සියයට 36 කින් ඉහළ නැඟුණි. විදේශීය ණය ආපසු ගෙවීම් වන රුපියල් දශ ලක්ෂ 3,024 ක්ද ගත් කල ශුද්ධ විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 9,036 ක් විය. කලින් ලබා ගත් ණයවල අවලංගු

## විදේශීය ණය සංයුතිය




ශ්‍රී ලංකා මහ බැංකුව.

කරන ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 43 ක් වූ අතර විනිමය අනුපාතිකයේ වෙනස්වීම් මත රුපියල් දශ ලක්ෂ 9,543 ක අමතර වගකීමක්ද විය. අවසාන ප්‍රතිඵලය වශයෙන් 1986 දී නොපියවන ලද විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 18,535 කින් වැඩි විය.

1986 අවසාන වනවිට නොපියවන ලද රුපියල් දශ ලක්ෂ 50,418 ක ව්‍යාපෘති ණය ප්‍රමාණය මුළු විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 59 ක් විය. 1985 වසර සමග සසඳනවිට එය සියයට 54 ක් විය. 1986 වසරේදී නොපියවන ලද භාණ්ඩ ණය කොටස සියයට 33 සිට සියයට 32 දක්වා පහත වැටුන අතර, අනිකුත් විදේශීය ණය කොටස සියයට 13 සිට සියයට 9 දක්වා පහත වැටුණි.

ව්‍යාපෘති සඳහා වූ ශුද්ධ විදේශීය ණය ගැනීම් පසුගිය වසරට වඩා සියයට 28 ක ඉහළ යාමක් පෙන්වමින් 1986 වසරේදී රුපියල් දශ ලක්ෂ 9,010 ක් විය. 1986 වසරේදී ව්‍යාපෘති ණය යටතේ වන මුළු විදේශීය ණය ගැනීම් වලින් වාණිජමය ණය පසුගිය වසරේ ප්‍රමාණයට සමාන අන්දමින් රුපියල් දශ ලක්ෂ 432 ක් විය. භාණ්ඩ ණය යටතේ ශුද්ධ ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 1,348 ක් වූ අතර එය පසුගිය වසරට වඩා සියයට 50 කින් ඉහළ නැඟුණි. 1986 වසරේදී අනෙකුත් ණය යටතේ ණය ආපසු ගෙවීම් රුපියල් දශ ලක්ෂ 1,322 ක් විය.

**පොළී ගෙවීම්**

රාජ්‍ය ණය සඳහා මුළු පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 9,294 ක් විය. මෙය පසුගිය වසරේ සියයට 14 ක වැඩි වීම සමඟ සසඳන විට සියයට 12 ක වැඩි වීමකි. දේශීය ණය යටතේ පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 7,159 ක් වූ අතර, විදේශීය ණය යටතේ පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 2,135 ක් විය. දේශීය ණය යටතේ පොළී ගෙවීම් සියයට 11 කින් ඉහළ ගිය අතර සැසඳීමේදී පසුගිය වසරේ එය සියයට 10 ක් විය. විදේශීය ණය යටතේ පොළී ගෙවීම් 1986 වසරේ සියයට 15 කින් ඉහළ ගිය අතර 1985 දී එය සියයට 24 ක් විය.

1986 වසරේදී දේශීය ණය යටතේ පොළී ගෙවීම් මුළු ණය සඳහා පොළී ගෙවීම් වලින් සියයට 77 ක් විය. මෙය රුපියල් ණය සඳහා වූ රුපියල් දශ ලක්ෂ 4,554 කින්ද, භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ රුපියල් දශ ලක්ෂ 2,601 කින් සහ පරිපාලන ණය සඳහා වූ රුපියල් දශ ලක්ෂ 4 කින්ද සමන්විත විය. 1985 දී වූ සියයට 9 ක වර්ධන වේගය සමඟ සසඳන විට 1986 වසරේදී රුපියල් ණය සඳහා පොළී ගෙවීම් සියයට 8 කින් වැඩි විය. මෙම පොළී ගෙවීම් අඩු වීමට හේතු වූයේ 1985 දී සියයට 14 ක් වූ පොළී අනුපාතිකය 1986 දී සියයට 12 දක්වා අඩු වීමය. පොළී අනුපාතිකය පහළ වැටුනද, භාණ්ඩාගාර බිල්පත් සඳහා පොළී ගෙවීම් සියයට 16 කින් ඉහළ නැගුනේ මූලික වශයෙන් 1986 වර්ෂය තුළදී භාණ්ඩාගාර බිල්පත් විශාල ප්‍රමාණයක් සේවාකරණය කිරීමට සිදු වීම නිසාය.

විදේශීය ණය යටතේ පොළී ගෙවීම, ව්‍යාපෘති ණය සඳහා වූ රුපියල් දශ ලක්ෂ 907 කින්ද, භාණ්ඩ ණය සඳහා වූ රුපියල් දශ ලක්ෂ 693 කින් සහ අනිකුත් ණය සඳහා වූ රුපියල් දශ ලක්ෂ 535 කින්ද සමන්විත විය. විදේශීය ණය මත වූ මුළු පොළී ගෙවීම් ප්‍රමාණය තුළ රුපියල් දශ ලක්ෂ 801 ක වාණිජ ණය සඳහා වූ පොළී ගෙවීම් ඇතුළත්ය.

1986 දී රාජ්‍ය ණය යටතේ වූ මුළු ණය සේවා ගෙවීම් රුපියල් දශ ලක්ෂ 16,823 ක් වූ අතර සැසඳීමේදී 1985 වසරේදී එය රුපියල් දශ ලක්ෂ 15,231 ක් විය. රුපියල් දශ ලක්ෂ 7,529 ක් වූ ණය ආපසු ගෙවීම් සියයට 9 ක වැඩි වීමක් වන අතර රුපියල් දශ ලක්ෂ 9,294 ක් වූ පොළී ගෙවීම් පසුගිය වසරට වඩා සියයට 12 ක වැඩි වීමක් පිළිබිඹු කරනු ලැබිනි. විදේශීය ණය යටතේ වූ මුළු සේවාකරණ ගෙවීම්වල රුපියල් දශ ලක්ෂ 3,025 ක ණය ආපසු ගෙවීම් හා රුපියල් දශ ලක්ෂ 2,135 ක පොළී ගෙවීම් ඇතුළත් විය. ණය ආපසු ගෙවීම් ප්‍රමාණයෙහි අඩු වීමක් තිබුන නමුදු, පොළී ගෙවීම් වැඩි වීම හේතුවෙන් දේශීය ණය යටතේ ණය සේවා ගෙවීම් 1985 වසරේදී රුපියල් දශ ලක්ෂ 11,585 සිට 1986 වසරේදී රුපියල් දශ ලක්ෂ 11,663 දක්වා වැඩි විය.

DISCARDED